# ප්‍රගති වාර්තාව

# 2024

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය



**ආචාර්ය උපාලි පන්නිලගේ**
ගරු අමාත්‍ය
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය



**වසන්ත පියතිස්ස**
ගරු නියෝජ්‍ය අමාත්‍ය
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය



**මලර්මදි ගංගාදරන්**
ලේකම්
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# පටුන



| | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන් | 1 – 2 |
| 02 | සේවක කළමනාකරණය | 3 |
| 03 | අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය | 4 |
| 04 | **අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතන ක්‍රියාත්මක වී ඇති ආකාරය** | |
| 4.1 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) | 5 – 10 |
| 4.2 | සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS) | 11 – 16 |
| 4.3 | ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD) | 17 – 21 |
| 4.4 | වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතිකසභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE) | 22 – 27 |
| 4.5 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB) | 28 – 29 |
| 4.6 | ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) | 30 – 36 |
| 4.7 | සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB) | 37 – 39 |
| 4.8 | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය(RDTRI) | 40 – 42 |
| 4.9 | උපදේශන අංශය | 43 – 45 |
| 4.10 | විදේශ ව්‍යාපෘති | 46 – 47 |
| 4.11 | අනෙකුත් මෙහෙයුම් අංශ | 48 – 49 |

# 1. හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය .මෙම අමාත්‍යාංශය කාන්තා හා ළමා කටයුතු අංශය සහ සමාජ සවිබලගැන්වීම් අංශය යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක වූ අතරසමාජයේ ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම් එනම් ආබාධ සහිත පුද්ගලයන්, වැඩිහිටි තැනැත්තන්, අඩු ආදායම්ලාභී පවුල්, මානසික ව්‍යාකූලතාවයන්ට පත්වූ පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණය සැලසීම හා අඩු ආදායම්ලාභී පවුල් සමාජ හා ආර්ථික වශයෙන් සවිබලගැන්වීම 2024 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම් අංශයේප්‍රධාන කාර්යභාරය විය. ඒ අනුව, අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි විය.

**දැක්ම** - "සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ සාධාරණව හා සමානව භුක්ති විඳින උසස් සමාජයක්"

**මෙහෙවර** - "ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ආර්ථික සවිබලගැන්වීම, කාන්තාවන්, ළමුන්, අවදානමට ලක්විය හැකි හා වරප්‍රසාද නොලබන පුද්ගලයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ආයතනික හා මානව සම්පත් සේවා සැපයීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම."

පසුව, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ තුළ තිරසාර සංවර්ධනයක් ප්‍රගමනය කිරීම, සමාජ ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ ස්වාධීන ප්‍රජාවක් ගොඩනැඟීම සඳහා ප්‍රජා සවිබල ගැන්වීම යන පැතිකඩ ආවරණය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2412/8 හා 2024.1125 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්‍ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය ලෙස ස්ථාපිත කොට ඇති මෙම අමාත්‍යාංශයේ වර්තමානයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

1. රජය මගින් කියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් විෂයයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන මූලාරම්භයන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම
5. සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකරදීම.
7. මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
8. ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබා දීම.
9. පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
10. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන් වලට අදාළ කටයුතු.
11. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

12. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහය හා එක්ව කටයුතු කිරීමට හැකි වනසේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම
14. වයෝවෘද්ධ තැනැත්තන් රැකබලාගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම

ඉහත කාර්යය හා කර්තව්‍යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටුකරගැනීම සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

**ග්‍රාමීය සංවර්ධන අංශය**

i. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
ii. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

**සමාජ ආරක්ෂණ අංශය**

i. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
ii. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
iii. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහජාතික මහ ලේකම් කාර්යාලය (NSE)
iv. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
v. උපදේශන අංශය

**ප්‍රජා සවිබලගැන්වීම් අංශය**

i. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

**අධ්‍යාපනික ආයතනය**

ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

තවද ඉහත ආයතනසඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහාය ලබාදීමට ආයතන අංශය, ගිණුම් අංශය, අභ්‍යන්තර විගණන අංශය, සංවර්ධන අංශ සහ සැලසුම් හා මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වේ.

ඒ අනුව, 2024 වර්ෂය සඳහා සමාජ සවිබලගැන්වීම්අංශයට අයත් වූ (වර්තමානයේ ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය) දෙපාර්තමේන්තු, ආයතන, අංශ හා ව්‍යාපෘති සඳහා අනුමතව තිබූ ප්‍රතිපාදන පිළිබඳව හා2024.12.31 දක්වා ලබාගෙන ඇති මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ.

## 2. සේවක කළමනාකරණය

| ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
| ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය (උපදේශන අංශයද ඇතුළුව) | 27 | 22 | 3 | 4 | 772 | 531 | 45 | 34 | **847** | **591** | **256** |
| **දෙපාර්තමේන්තු/ ආයතන/ අංශ** | | | | | | | | | | | |
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 131 | 63 | 369 | 1,431 | 24,800 | 21,009 | 431 | 441 | **25,731** | **22,944** | **2,787** |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 8 | 7 | 502 | 229 | 693 | 638 | 288 | 242 | **1,491** | **1,116** | **375** |
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය | 6 | 5 | 3 | 2 | 53 | 39 | 6 | 2 | **68** | **48** | **20** |
| ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 7 | 4 | 2 | 1 | 115 | 102 | 23 | 12 | **147** | **119** | **28** |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 8 | 7 | 14 | 11 | 133 | 93 | 43 | 39 | **198** | **150** | **48** |
| ජාතිකසමාජ සංවර්ධන ආයතනය | 53 | 33 | 9 | 5 | 49 | 35 | 26 | 20 | **137** | **93** | **44** |
| සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය | 14 | 9 | 4 | 0 | 74 | 29 | 10 | 2 | **102** | **40** | **62** |
| ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය | 4 | 3 | 14 | 11 | 21 | 18 | 11 | 7 | **50** | **39** | **11** |
| **එකතුව** | **258** | **153** | **920** | **1,694** | **26,710** | **22,494** | **883** | **799** | **28,771** | **25,140** | **3,631** |

# 3. අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සාරාංශය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සඳහා 2024වර්ෂයෙහි වැය ශීර්ෂය 171 යටතේද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වැය ශීර්ෂ 331 යටතේද සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේද ප්‍රතිපාදන වෙන් වී ඇත.

ඒ අනුව, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සමාජ සවිබලගැන්වීම්අංශය (වර්තමානයේ ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය)සඳහා අනුමත වූ මුළු ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| වියදම් වර්ගය | 2024 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මිලියන) | 2024.01.01 සිට 2024.12.31දක්වා මූල්‍ය ප්‍රගතිය(රු.මිලියන) |
|---|---|---|
| **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (සමාජ සවිබලගැන්වීම් අංශය )- වැය ශීර්ෂ 171** | | |
| ප්‍රාග්ධන | 1,364.50 | 341.39 |
| පුනරාවර්තන | 1,281.29 | 1,171.50 |
| **උප එකතුව** | **2,645.80** | **1,512.88** |
| **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 331** | | |
| ප්‍රාග්ධන | 72.00 | 62.41 |
| පුනරාවර්තන | 57,860.74 | 21,289.46 |
| **උප එකතුව** | **57,932.74** | **21,351.87** |
| **සමාජ සේවා දෙපාර්තමේන්තුව - වැය ශීර්ෂ 216** | | |
| ප්‍රාග්ධන | 116.15 | 89.37 |
| පුනරාවර්තන | 1,387.77 | 1,219.08 |
| **උප එකතුව** | **1,503.92** | **1,308.35** |
| **මුළු එකතුව** | **62,082.46** | **24,173.10** |

# 4. අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතන ක්‍රියාත්මක වී ඇති ආකාරය

## 4.1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම අරමුණු කොටගෙන, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සෑම දිළිඳු පුද්ගලයෙකු තුළම පවතින සැඟවුණු විභවතාවන් යටපත් කරගෙන ඇති බාධක දුරලමින්,එම පවුල් සවිබලගැන්වීම, සමාජ ආරක්ෂණය සහ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත හා 2013 අංක 1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත කර ඇත.

### අරමුණු

- අඩු ආදායම්ලාභී පවුල් ආර්ථික,සමාජීය හා මානසික යන අංශයන්ගෙන් බලගන්වා තිරසර හා උසස් ජීවන මට්ටමක් අත්කරගත් පවුල් ඒකක බවට පත් කිරීම.
- අඩු අදායම්ලාභී පවුල් වල සමාජ ආරක්ෂණය සහතික කිරීම.

### කාර්යභාරය

- 2025 සිට 2029 දක්වා වසර 05ක කාලය තුළ, බහුමාන දරිද්‍රතාවයට මුහුණ දී ඇති පවුල් මිලියන 2 ක් ආර්ථික,සමාජීය හා මානසික යන අංශ යටතේ සවිබලගැන්වීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග හා ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබාදීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස වැඩි දියුණු කිරීම සඳහා නිවාස ආධාර ලබාදීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල සමාජ සංවර්ධනය අරමුණු කර ගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය-2024.12.31 දිනදක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---:|---:|
| ප්‍රාග්ධන | 72.00 | 62.41 |
| පුනරාවර්තන | 57,860.74 | 21,289.46 |
| එකතුව | 57,932.74 | 21,351.87 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| **ව්‍යාපෘති අංක 01** | **"අස්වැසුම" ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන** |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | බහුමාන දරිද්‍රතාවයට මුහුණ පා ඇති පවුල් සංඛ්‍යාව අවම කිරීම අරමුණු කර ගනිමින් අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන අතර එය ප්‍රධාන මූල්‍ය සංරචක 03ක් යටතේ සිදුවේ.<br>1. දේශීය අරමුදල්.<br>2. ආසියානු සංවර්ධන බැංකු ණය අධාර.<br>3. ලෝක බැංකු ණය ආධාර.<br>දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක සවිබලගැන්වීමේ වැඩසටහන් වලට අදාල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහතින් දක්වා ඇති අතරවිදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය පිටු අංක 46 යටතේ ඉදිරිපත් කර ඇත. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන(දේශීය) (රු.මි) | 6.30 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 5.55 |
| භෞතික ප්‍රගතිය | • දිස්ත්‍රික් නිලධාරීන් හා ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් පවත්වා ඇත.<br>• සවිබලගැන්වීම සඳහා සුදුසුකම්ලත් පවුල් 260,340 ක් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගෙන ඇත.<br>• සවිබලගැන්වීම සඳහා හඳුනාගත් පවුල් සඳහා පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා තොරතුරු රැස් කිරීම ග්‍රාම සේවා වසම් මට්ටමින් ආරම්භ කර ඇත. |

| **ව්‍යාපෘති අංක 02** | **සවිබලගැන්වීමේ පවුල් සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන** |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | අතුරු බෝග නිෂ්පාදන පාදක සුහුරු කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම, ජීවනෝපාය සංවර්ධනය, ධීවර සංවර්ධනය, කුඩා හා ප්‍රාථමික කර්මාන්ත ප්‍රවර්ධනය, අගය එකතු කිරීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 21.70 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 21.50 |
| භෞතික ප්‍රගතිය | අතුරු බෝග නිෂ්පාදන පාදක සුහුරු කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම<br>• පවුල් 58<br>• ජීවනෝපාය සංවර්ධනය - පවුල් 49<br>• ධීවර සංවර්ධනය - පවුල් 47<br>• කුඩා හා ප්‍රාථමික කර්මාන්ත ප්‍රවර්ධනය - පවුල් 54<br>• අගය එකතු කිරීමේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම - පවුල් 67 |

| **ව්‍යාපෘති අංක 03** | **සවිබලගැන්වීමේ පවුල් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන** |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | Mini Food City ජාලය නිර්මාණය කිරීම, RPL පද්ධතිය යටතේNVQ සහතික ලබාදීම (I සහII මට්ටම), වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, භාෂා කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම (ජපන්, කොරියානු, ඉංග්‍රීසි), ව්‍යවසායකත්ව |

| | |
|---|---|
| | ධාරිතාව සංවර්ධන වැඩසටහන (දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම), කාබනික ආහාර නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන, සුව බොජුන් සහ අලෙවි මධ්‍යස්ථාන සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ නිෂ්කාශනය කිරීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 11.70 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 9.43 |
| භෞතික ප්‍රගතිය | Mini Food City 25 ක් ජාලයට සම්බන්ධ වීම,<br>RPL පද්ධතිය යටතේNVQ සහතික ලබාදීම (I සහII මට්ටම) - තරුණ තරුණියන්174<br>වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් - 265 ප්‍රතිලාභීන් 13,324<br>වෘත්තීය පුහුණු වැඩසටහන් - තරුණ තරුණියන්253<br>භාෂා කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් (ජපන්, කොරියානු, ඉංග්‍රීසි) - වැඩසටහන අවසන්වී ඇති අතර මෙම වැඩසටහන දිස්ත්‍රික්ක 08 ක තරුණ තරුණියන් 1,008 ක් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ ජාතික සංවර්ධන අධිකාරියේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක වේ.<br>ඉදිරි කටයුතු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් සිදු කරනු ලැබේ<br>ව්‍යවසායකත්ව ධාරිතාව සංවර්ධන වැඩසටහන් - පුද්ගලයන් 4,415<br>කාබනික ආහාර නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් - 2<br>සුව බොජුන් සහ අලෙවි මධ්‍යස්ථාන සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ නිෂ්කාශනය කිරීම - වැඩසටහන් 2 |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 04** | **සමාජ සංවර්ධන වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | ළමුන් සඳහා සංස්කෘතික හා සාක්ෂරතා වැඩසටහන, දුම්පානය සහ මත්ද්‍රව්‍යනිවාරණ වැඩසටහන, |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2.87 |
| භෞතික ප්‍රගතිය | ළමුන් සඳහා සංස්කෘතික හා සාක්ෂරතා වැඩසටහන් - 180<br>දුම්පානය සහ මත්ද්‍රව්‍යනිවාරණ වැඩසටහන් - 213 |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 05** | **ප්‍රජා මූලික සංවිධාන වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.50 |
| භෞතික ප්‍රගතිය | රැස්වීම් 50 |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 06** | **නීතිමය වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | තෝරාගත් පවුල් ඒකකවල නීතිමය ගැටලු විසඳීමට සහාය වීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.87 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 11 |


**දෙපාර්තමේන්තුගත අරමුදල් යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| සමෘද්ධි බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය අරමුදල | |
|---|---|
| **ව්‍යාපෘතිය01** | **දුප්පත් සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 40,000.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 39,948.47 |
| භෞතික ප්‍රගතිය | ක්ෂුද්‍ර මූල්‍ය ණය 269,295 |
| | |
| **ව්‍යාපෘතිය02** | **ආගමික හා සංස්කෘතික සැමරීම්** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 27.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 17.76 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 03 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **මාධ්‍ය සහ ප්‍රචාරණය** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 28.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.10 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 01 |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **බැංකු සඳහා පොලී සහන ගෙවීම සහනදායී පොලී අනුපාත යටතේ ප්‍රතිලාභීන් සඳහා ණය නිකුත් කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 115.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 7.60 |
| භෞතික ප්‍රගතිය | බැංකු 01 |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **බැංකු පරිගණක වැඩසටහන සඳහා යටිතල පහසුකම්** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 40.60 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.83 |
| භෞතික ප්‍රගතිය | බැංකු 03 |
| | |
| **ව්‍යාපෘති අංක 06** | **බැංකු සහ බැංකු සමිති සඳහා ගොඩනැගිලි යටිතල පහසුකම්, අනෙකුත් පහසුකම් සහ උපකරණ සැපයීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 125.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 10.05 |
| භෞතික ප්‍රගතිය | බැංකු 05 |
| | |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 07** | **පුහුණු වැඩසටහන් පැවැත්වීම (කළමනාකරනය සහ ගිණුම්කරණ පුහුණුව, ණය කළමණාකරණය සහ අවදානම් කළමනාකරනය පුහුණුව, ක්ෂුද්‍රමූල්‍ය සහතිකය සහ ඩිප්ලෝමාව සහ ආකල්ප සංවර්ධනය)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 35.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.94 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 12 |
| | |
| **සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල්** | |
| **ව්‍යාපෘති අංක 01** | **සමෘද්ධි පවුල්වල උසස් පෙළ සිසුන් සඳහා "සිප්දොර" ශිෂ්‍යත්ව ලබාදීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 774.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 668.51 |
| භෞතික ප්‍රගතිය | සිසුන් 40,341 |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **නිලාවේලි පුහුණු මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහන (ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම සහ යන්ත්‍රෝපකරණ සහ උපකරණ සැපයීම)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 21.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 4.47 |
| භෞතික ප්‍රගතිය | අලුත්වැඩියා කටයුතු 30% ක් සම්පූර්ණ කර ඇති අතර යන්ත්‍රෝපකරණ යම් ප්‍රමාණයක් ලබා දී ඇත. (වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගෙන ඇත.) |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.05 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2.72 |
| භෞතික ප්‍රගතිය | මුද්‍රණ යන්ත්‍ර 26 ක් ප්‍රාදේශීය හා දිස්ත්‍රික්කාර්යාල වලට ලබා දී ඇත. පරිගණක මෘදුකාංග සංවර්ධනය, කාර්යාල උපකරණ හා මුද්‍රණ යන්ත්‍ර අලුත් වැඩියා කිරීම |
| | |
| **නිවාස ලොතරැයි අරමුදල්** | |
| **ව්‍යාපෘති අංක 01** | **නිවාස සංවර්ධන වැඩසටහන (රුපියල් 750,000/ -)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 502.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 456.50 |
| භෞතික ප්‍රගතිය | නිවාස 670 ක සංවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **විශේෂ අවධානයක් ඇති පුද්ගලයින් සඳහා නිවාස සංවර්ධන වැඩසටහන (රු.750,000/- )** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 12.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 12.25 |
| භෞතික ප්‍රගතිය | නිවාස ඒකක 25 ක සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. |
| | |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 03** | **රු.250,000 විශේෂ අවධානයක් ඇති පුද්ගලයින් සඳහා නිවාස සංවර්ධන වැඩසටහන** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 15.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 14.90 |
| භෞතික ප්‍රගතිය | නිවාස ඒකක 50 ක සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. |
| | |
| **ජාතික සමාජ සංවර්ධන අරමුදල** | |
| **ව්‍යාපෘති අංක 01** | ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය සැමරීම සඳහා කොඩි දින වැඩසටහන (මැයි 31 දා) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 7.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 7.00 |
| භෞතික ප්‍රගතිය | දිස්ත්‍රික්ක 25 ආවරණය කරමින් එක් වැඩසටහනක් පවත්වා ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **රැස්වීම්, පුහුණුවීම්, ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 37.20 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 9.13 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 11 ක් පවත්වා ඇත. |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



# 4.2. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)

## හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිතකොට ඇත.

වර්තමාන රජයේ කිසිවෙකු අත් නොහැර යන ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වරප්‍රසාද නොලත් රටේ සමස්ත ප්‍රජාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වා ක්‍රියාත්මක වන අන්තර්කරණීය සමාජ ආරක්ෂණ වැඩසටහනක් 2025 වර්ෂයේ සිට හඳුන්වාදීමට බලාපොරොත්තුවේ.

එහිදී, අමාත්‍යාංශය යටතේ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හා උපදේශන අංශය යන සියලුම ආයතන සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ වෙමින් ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගත් දත්ත පද්ධතියක් හරහා සකස් කරන ලද පුනරුත්ථාපන සැලසුම් අනුව සමාජ ආරක්ෂණ හා සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.

## අරමුණු

- ආබාධ සහිත තැනැත්තන් ඇතුළු අනෙකුත් ආන්තීකරණයට හා අවාසි සහගත තත්වයන්ට පත් වරප්‍රසාද නොලත් ප්‍රජාවගේ සමාන අයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජ ආරක්ෂාව තහවුරු කිරීම.
- ආබාධ සහිත තැනැත්තන් සඳහා ආදායම් උත්පාදනයට ප්‍රවේශ සැපයීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස්කිරීම.

## කාර්යභාරය

- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන තුළින් ආබාධ සහිතතරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම
- ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් නව තාක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොළට සරිලන පරිදි සංවර්ධනය කිරීම.
- ආබාධ සහිත සහිත ළමුන් සඳහා කල්තියා මැදිහත්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සමාජගත කිරීම
- දෙමාපිය භාරකරුවන් අහිමි ආබාධ සහිත පුද්ගලයන් සඳහා පූර්ණ කාලීන නේවාසික රැකවරණයලබාදීම හා සවිබලගැන්වීම
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගතකිරීම
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කටයුතු සිදු කිරීම

- ප්‍රජා මූලික පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කර ප්‍රචලිත කිරීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමෙන් මෙහෙයුම් කමිටු හරහා අධීක්ෂණය වන ස්වශක්ති සංවිධාන මඟින් පුනරුත්ථාපන සැලසුම් හරහා සේවාදායකයන් සවිබලගැන්වීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම
- රිදියගම නිවර්තන නිවාසය හරහා යාචකයින් පුනරුත්ථාපනය කිරීම

## 2024 අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ප්‍රාග්ධන** | 116.15 | 89.37 |
| **පුනරාවර්තන** | 1,387.77 | 1,219.08 |
| **එකතුව** | 1,503.92 | 1,308.35 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| **පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති** | |
|---|---|
| **ව්‍යාපෘති අංක 01** | **වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | අවුරුදු 16-35 අතර වයසේ පසුවන ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කර ගනිමින් දිවයින පුරා ක්‍රියාත්මකවෘත්තීය පුහුණු ආයතන 11ක් හරහා වෘත්තීය පුහුණුව ලබා දීම සිදු කරයි. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 36.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 35.60 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 491 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, වෘත්තීය පුහුණුව ලබන ආබාධ සහිත පුද්ගලයන් 491 ක් සඳහා සුබසාධක අයිතමයන් (T shirts,ඇඳ ඇතිරිලි හා වෙනත් ) ලබාදීම, වෘත්තීය පුහුණුව නිමකළ ආබාධ සහිත පුද්ගලයන් 82 ක් සඳහා වෘත්තීය උපකරණ කට්ටල ලබාදීම, ආබාධ සහිත දරුවන් 153 ක් සඳහා මාර්ගෝපදේශ සැපයීම, ගුරුවරු 49 ක් සඳහා දීමනා ලබාදීම |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම** |
| ව්‍යාපෘති සාරාංශය | මත් ද්‍රව්‍ය නිවාරණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් සමාජ සජීවීකරණ වැඩසටහන් පැවැත්වීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.50 |

| | |
|---|---|
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.496 |
| භෞතික ප්‍රගතිය | දිස්ත්‍රික් මට්ටමින් මත් නිවාරණ හා සමාජ සජීවීකරණ වැඩසටහන් 27 ක් පැවැත්වීම, පුනරුත්ථාපනය වූ පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් සහ අදාළ නිලධාරීන් සඳහා පසු විපරම් වැඩසටහන් 5 ක් පැවැත්වීම |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල** |
| ව්‍යාපෘති සාරාංශය | දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම සඳහා 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල් පනතයටතේ පිහිටුවා ඇති දෘශ්‍යාබාධිත පුනරුත්ථාන භාර අරමුදල හරහා වැඩසටහන් ක්‍රියාත්මක තිරීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 9.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 8.31 |
| භෞතික ප්‍රගතිය | උසස් පෙළ සමත් දෘශ්‍යාබාධිත දරුවන් 330 ක් සඳහා මාසික දීමනා ලබාදීම, උසස් අධ්‍යාපනය හදාරන දරුවන් සඳහා ජංගම දුරකථන 16ක් ලබාදීම, සුදු සැරයටි දිනය සැමරීම |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **ආබාධ සහිත පුද්ගලයන්ගේ විනෝදාත්මක කටයුතු සඳහා පහසුකම් සැලසීම** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත පුද්ගලයන්ගේ විනෝදාත්මක කටයුතු සඳහා අදාළ උත්සව හා වැඩසටහන් පැවැත්වීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 10.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 8.58 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් සඳහා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරඟයක් , සිත් රූ වැඩසටහන පැවැත්වීම හා සංඥා භාෂා දිනය සැමරීම |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **වෘත්තීය පුහුණුව ලබන ආබාධ සහිත තරුණ/ තරුණියන් සඳහා දෛනික දීමනා ලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව හදාරණ ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා දෛනික දීමනා ලබා දීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 30.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 27.61 |


| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 855 |
| | |
| **ව්‍යාපෘති අංක 06** | **පුවක්පිටිය - ජයවිරු සමාධි ආයතනය** |
| ව්‍යාපෘති සාරාංශය | පුවක්පිටිය ජයවිරු සමාධි ආයතනය හරහා නේවාසිකව මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 8.69 |
| භෞතික ප්‍රගතිය | මතට ඇබ්බැහිවූ පුද්ගලයන් 109 |
| | |
| **ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති** | |
| **ව්‍යාපෘති අංක 07** | **ප්‍රජාමූලික මූලික පුනරුත්ථාපන වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් අතරත්, ඔවුන් හා ඔවුන් ජීවත් වන ප්‍රජාවේ සමාජ සංවිධාන අතරත්, සබඳතා තර කිරීම මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බලගැන්වීම හා ස්වාධීනව කටයුතු කිරීමට හැකිවන පරිදි ඔවුන් සංවර්ධනය කිරීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 11.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 10.27 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් සහ දරුවන් 60 දෙනෙකු සඳහා සෘජු ආධාර ලබා දීම ,ස්වාභිමානී වැඩසටහන පැවැත්වීම, ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීමට අදාළ ව්‍යාපෘති 22 ක් සම්පූර්ණ කිරීම |
| | |
| **ව්‍යාපෘති අංක 08** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණය** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කර ගනිමින් පවත්වාගෙන යනුලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවීකරණය සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 24.91 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 23.63 |
| භෞතික ප්‍රගතිය | කැටවල, අමුණුකුඹුර, මාදම්පේ, සීදූව, වත්තේගම, කලවානවෘත්තීය පුහුණු මධ්‍යස්ථාන , පුවක්පිටිය ජයවිරු සමාධි, ජයවිරු සෙවණ මධ්‍යස්ථාන හා සිතිජය, නාවින්න ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානවල අළුත්වැඩියා කටයුතු සහ නවීකරණ කටයුතු සිදුකිරීම. |
| | |


| වයාපෘති අංක 09 | රිදියගම නිවර්තන නිවාසය නවීකරණය සහ අළුත්වැඩියාව |
|---|---|
| වයාපෘති සාරාංශය | රිදියගමයාවකයින් පුනුරුත්තාපනය සඳහා ක්‍රියාත්මක රිදියගම නිවර්තන නිවාසයෙහිවැඩි දියුණු කිරීම් කටයුතු සිදුකිරිම |
| වයාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 10.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 7.03 |
| භෞතික ප්‍රගතිය | භෝජනාගාරය අළුත් වැඩියා කිරීම |

| වයාපෘති අංක10 | කිළිනොච්චි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම |
|---|---|
| වයාපෘති සාරාංශය | ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කර ගනිමින් කිළිනොච්චි ප්‍රදේශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු සිදුකිරිම |
| වයාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 30.087 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 11.78 |
| භෞතික ප්‍රගතිය | භෝජනාගාරයේ සිවිලිම සවිකිරීම සහ පොළොව ටයිල් කිරීම, පරිපාලන ගොඩනැගිල්ලෙහි දොර ජනෙල් සවිකිරීම (සැලසුම් කරන ලද ප්‍රමාණයෙන් 55%) |

| වයාපෘති අංක11 | නිලධාරී පුහුණුව |
|---|---|
| වයාපෘති සාරාංශය | ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා වැඩසටහන් පැවැත්වීම |
| වයාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.25 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 46 |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



# 4.3.ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය(NSPD)

## හැඳින්වීම

ආබාධසහිතතැනැත්තන්සඳහාවනජාතිකසභාව සහ ජාතික මහලේකම්කාර්යාලය 1996 අංක 28 දරණආබාධසහිතතැනැත්තන්ගේඅයිතිවාසිකම්ආරක්ෂාකිරීමේපනතයටතේපිහිටුවාඇත.
ආබාධසහිතතැනැත්තන්සඳහා වූජාතිකසභාවමගින්ගන්නාවූප්‍රතිපත්තිමයතීරණක්‍රියාත්මකකිරීම හා ආබාධසහිතතැනැත්තන්සඳහාහිතකරපරිසරයක්උදාකරදීමඋදෙසාආබාධසහිතතැනැත්තන්ගේඅයිතිවාසිකම්ප්‍රවර්ධනයකිරීමහාඔවුන්ගේසුභසාධනයඇතුළුසහනසැලසීමආබාධසහිතතැනැත්තන්සඳහා වූජාතිකමහලේකම්කාර්යාලය මඟින් සිදුකරයි.

## අරමුණු

- ආබාධසහිතපුද්ගලයන් සඳහාහිතකරපරිසරයක්ගොඩනැගීම
- ආබාධසහිතපුද්ගලයන්, ඔවුන්ගේකුටුම්භසහප්‍රජාවන් ස්වශක්තියෙන් හා ඔරොත්තු දීමේහැකියාවෙන් යුතුවඔවුන්ගේ සමාජීයසහආර්ථිකජීවිතනගාසිටුවීමසඳහාබලගැන්වීම
- සැමටසමානඅයිතිවාසිකම්, අවස්ථා, නිදහස හා සමාජආරක්ෂාවසහතිකකිරීම.

## කාර්යභාරය

- ආබාධ සහිත තැනැත්තන් සුභසාධනය ප්‍රවර්ධනයකිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සෞඛ්‍යය,අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ ප්‍රවේශ පහසුකම් සඳහා අවස්ථා පුළුල් කිරීම

## අනුමතවාර්ෂිකප්‍රතිපාදන -2024 සහප්‍රගතිය- 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 50.00 | 50.00 |
| පුනරාවර්තන | 21.00 | 9.22 |
| එකතුව | 71.00 | 59.22 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති අංක1 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබාදීම |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | අඩු ආදායම් ලබන ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්,අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි ඇස් කණ්ණාඩි, රෝදපුටු, ශ්‍රවණ උපකරණ,ත්‍රෛසිකල්, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා වෛද්‍ය නිර්දේශ මත උපරිම රු. 20,000 දක්වා මුදල් ආධාර ලබා දේ. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 11.47 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 10,449 (ශ්‍රවණ උපකරණ 13, රෝද පුටු 98, කොමඩ් සහිත රෝද පුටු 38, වැලමිට අත්වාරු 100, කිහිළිකරු 42, ඇවිදීමේ රාමු 63, දුර සහ ළඟ පෙනෙන කණ්ණාඩි 83, කණ්ණාඩි 10,000, විශේෂ බඳපටි 2,විශේෂ පාවහන් 5, කෘත්‍රිම පාද 3) |
| | |
| ව්‍යාපෘති අංක 2 | වෛද්‍යාධාර ලබාදීම |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් ආබාධ තත්ත්වයට පත්වීම වැළැක්වීම ද අරමුණු කර ගනිමින් මුළු දිවයිනම ආවරනය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. එහි දී රජයේ රෝහල් මගින් නොසපයන ඖෂධ ලබා ගැනීමට, සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක , ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම් ලබන පවුල් සඳහා උපරිමය රු.20,000ක් දක්වා මේ යටතේ ආධාර ලබා දේ. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 16.17 |
| භෞතික ප්‍රගතිය | පුද්ගලයන් 630 |
| | |
| ව්‍යාපෘති අංක 3 | ආබාධ සහිත තැනැත්තන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම |
| ව්‍යාපෘති සාරාංශය | ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා ආබාධ සහිත තැනැත්තෙකුට හෝ පවුලකට උපරිමය රුපියල්40,000ක් දක්වා ලබා දීම සහ ස්වයං රැකියා නියාමනය වැඩිදියුණු කිරීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ මාර්ගෝපදේශනය සහ අලෙවිකරණ මැදිහත්වීම සිදු කරනු ලැබේ. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.84 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 175 |
| | |
| ව්‍යාපෘති අංක 4 | ආබාධ සහිත තැනැත්තන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත දරුවන් සඳහා උපරිමය රු.20,000ක් දක්වා ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත ලබා දෙන අතර එය එකවර පමණක් ලබාදෙන දීමනාවක් ලෙස ලබා දේ. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 11.74 |

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත ළමුන් 684 |
| **ව්‍යාපෘති අංක 5** | **ආබාධසහිතතැනැත්තන්ගේ කුසලතා සංවර්ධනය සඳහාආධාරලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000/- ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.39 |
| භෞතික ප්‍රගතිය | ආයතන 08 |
| | |
| **ව්‍යාපෘති අංක 6** | **ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීම සඳහා ආධාර ලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීම. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.69 |
| භෞතික ප්‍රගතිය | ආයතන 04 |
| | |
| **ව්‍යාපෘති අංක 7** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා අවස්ථා ලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | ආබාධ සහිත පුද්ගලයින් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීම සහ ඔවුන්ගේ වැටුපෙන්50% (උපරිම රු.15,000) ක් දක්වා රජය විසින් ගෙවීම සිදුකරයි. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.22 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 97(2023 – 31/ 2024 - 66) |
| | |
| **ව්‍යාපෘති අංක 8** | **වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම** |
| ව්‍යාපෘති සාරාංශය | වික්ටෝරියා නිවාසයේ සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම් සිදු කිරීම. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 9.00 |
| භෞතික ප්‍රගතිය | වික්ටෝරියා නිවාසයේ සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම් සිදු කිරීම. |
| | |
| **ව්‍යාපෘති අංක 9** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දිනයට සමගාමීව පැවැත්වූ වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව "ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම තුලින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම" පිළිබඳ තේමාව යටතේ සාකච්ඡාමය වැඩසටහනක් හා ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරනය වූ තිරසාර අනාගතයක් උදෙසා ඔවුන්ගේ නායකත්වය පුහුණු කිරීම |

| | |
|---|---|
| | යන තේමා ඔස්සේ වැඩසටහනක් පැවැත්වීම. |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.52 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 02 |

## වෙනත් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

**"සුපිරි වාසනා සම්පත"ලොතරැයි අරමුදල් ආදායමෙන්** 5% ක ප්‍රතිපාදන වලින් ගොඩනඟා ඇති නිවාස අරමුදල මඟින් අඩු ආදායම් සහිත ආබාධ සහිත පුද්ගලයන් සඳහා පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

| **ව්‍යාපෘති අංක1** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම** |
|---|---|
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 27.46 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 204 |
| | |
| **ව්‍යාපෘති අංක 2** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම** |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.59 |
| භෞතික ප්‍රගතිය | ආබාධ සහිත පුද්ගලයන් 66 |

## වෙනත් වැඩසටහන්

- **ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට නව පනතක් සැකසීම සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍ය සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයසඳහා 2023.03.13 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව,නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අවසන් පනත් කෙටුම්පතට අදාලව ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා වර්ෂ 2024.02.07 නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

2024.06.12 වන දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් අවසන් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දී ඇති අතර2024.09.09 වන දින නීති කෙටුම්පත් සම්පාදකදෙපාර්තමේන්තුව විසින් පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.එහි තවදුරටත් සංශෝධන ඇතුලත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර ඒම කමිටුව විසින් අදාල සංශෝධන සිදු කරමින් පවතී.


- **සංඥා භාෂා පනත් කෙටුම්පත**

සංඥා භාෂා පනත් කෙටුම්පතෙහි අවසන් කෙටුම්පත 2024.02.12 වන දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කර එවා ඇති අතර එම කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.

- **ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය**

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2006 අංක 1 දරන ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ජාත්‍යන්තරමට්ටමේ ප්‍රමිතීන් හා පිරිවිතරයන් සැලකිල්ලට ගෙනප්‍රවේශ නියෝග කෙටුම්පත් කර ඇති අතර අදාළ පාර්ශවයන්ගෙන් නිරීක්ෂණ ලබා ගනිමින් පවතී.

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



## 4.4. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

### හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවීම සිදු කර ඇත.

### අරමුණු

- වැඩිහිටි තැනැත්තන්ගේ කායික හා මානසික සමතුලිතතාවය සහ නිරෝගීභාවය පවත්වාගෙන යාම හා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම
- වැඩිහිටි තැනැත්තන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම

### කාර්යභාරය

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුභසාධනය ලබාදීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මඟින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සූදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 5.00 | 5.00 |
| පුනරාවර්තන | 16.80 | 15.88 |
| එකතුව | 21.80 | 20.88 |

### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### පුනරාවර්තන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

| ව්‍යාපෘති අංක 01 | ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි සංවිධාන දැනුවත් කිරීම |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු/ ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල/ දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල හා පළාත් වැඩිහිටි බලමණ්ඩල සඳහා මූල්‍යමය අනුග්‍රහය දක්වමින් ඔවුන්ව අධීක්ෂණය කිරීම හා දැනුවත් කිරීම |

| | |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.19 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.19 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 1 |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **පාසල් ළමුන් දැනුවත්කිරීමේ වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | වැඩිහිටිභාවය සහ වැඩිහිටියන් රැකබලාගැනීම පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.53 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.53 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 15 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම** |
| ව්‍යාපෘති සාරාංශය | වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා විශේෂිත වූ හැඳුනුම්පත් ලබාදීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.47 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.45 |
| භෞතික ප්‍රගතිය | හැඳුනුම්පත් 37,517 |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **මාලිගාතැන්න වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2.10 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2.09 |
| භෞතික ප්‍රගතිය | පරිපාලන කටයුතු |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.36 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.36 |
| භෞතික ප්‍රගතිය | සභාවාර 10 |
| | |
| **ව්‍යාපෘති අංක 06** | **වැඩිහිටි නඩත්තු මණ්ඩලය පවත්වාගෙන යාම** |
| ව්‍යාපෘති සාරාංශය | පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයට, අසරණ භාවයට පත් දෙමාපියන් යොමු කරමින් ඔවුන් හට නඩත්තු මුදල් ලබා දිමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.63 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.55 |

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | නඩු 103 |

## වැඩිහිටි සුබසාධන ජාතික අරමුදල මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 01** | **"ආරෝග්‍යා" වෛද්‍ය ආධාර වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | කිසිදු දීමනාවකට හිමිකම් නොකියන, නිදන්ගත බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන් සඳහා රුපියල්25,000 බැගින් ලබාදීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 50.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 50.00 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටියන් 2000 |
| **ව්‍යාපෘති අංක 02** | **ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආධාරක උපකරණ ලබාදීම** |
| ව්‍යාපෘති සාරාංශය | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශ්‍රවණාධාර, අක්ෂිකාච හා ඇස්කණ්ණාඩි ලබාදීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 114.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 75.90 |
| භෞතික ප්‍රගතිය | ශ්‍රවණාධාර 2000, අක්ෂිකාච 761, ඇස්කණ්ණාඩි 3000 |
| **ව්‍යාපෘති අංක 03** | **වැඩිහිටියන් රැකබලාගැනීමේ වැඩසටහන** |
| ව්‍යාපෘති සාරාංශය | වැඩිහිටි නිවාසවල පාලක/ පාලකවරියන් සඳහා වැඩිහිටියන් රැකබලාගැනීම පිළිබඳව වැඩසටහන් පැවැත්වීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.36 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි නිවාසවල පාලක/ පාලකවරියන්246 |
| **ව්‍යාපෘති අංක 04** | **වැඩිහිටි නිවාස නඩත්තුව සහ පරිපාලනය** |
| | පන්නල"Welcome"වැඩිහිටි නිවාසය", දෙහිඅත්තකණ්ඩිය"සරණ"වැඩිහිටි නිවාසය, කතරගම වැඩිහිටි නිවාසය |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 15.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 10.012 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි නිවාස වල පරිපාලන කටයුතු |
| **ව්‍යාපෘති අංක 05** | **කතරගම වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 150.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 114.959 |
| භෞතික ප්‍රගතිය | 35% (සමුච්ඡිත 86%) |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 06** | **වැඩිහිටි නිවාස ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපකරණ ආධාර ලබාදීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 40.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 30.88 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි නිවාස 15 ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම (2023 වර්ෂයේ ඉදි කළ වැඩිහිටි නිවාස 08කගෙවීම් සිදු කර ඇත) |
| | |
| **ව්‍යාපෘති අංක 07** | **වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ආධාර ලබාදීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 70.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 21.98 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 13 ක ඉදිකිරීම් කටයුතු |
| | |
| **ව්‍යාපෘති අංක 08** | **අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයින් සඳහා නිවාස ඉදි කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක දිරිය පියස නිවාස වැඩසටහන** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 52.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 44.80 |
| භෞතික ප්‍රගතිය | නිවාස 64 |
| | |
| **ව්‍යාපෘති අංක 09** | **වැඩිහිටියන්ට තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක“සුවපහසු” මූල්‍යාධාර යෝජනා ක්‍රමය.** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 150.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 150.00 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටියන් 2,876 |
| | |
| **ව්‍යාපෘති අංක 10** | **වැඩිහිටි ආගමික චාරිකා සංවිධානය කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 28.13 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 28.12 |
| භෞතික ප්‍රගතිය | චාරිකා 375 |
| | |
| **ව්‍යාපෘති අංක 11** | **ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු බලගැන්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 60.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 57.51 |
| භෞතික ප්‍රගතිය | කමිටු 575 |
| | |

| **ව්‍යාපෘති අංක 12** | **වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා උපකරණ මිලදී ගැනීමට මුල්‍යාධාර ලබාදීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 12.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 12.46 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 25 |

| **ව්‍යාපෘති අංක 13** | **වැඩිහිටියන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා (යෝගා පුහුණුව) සහ ඩිජිටල් සාක්ෂරතාවය සහ ජීවනෝපාය සම්බන්ධ වැඩසටහන** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 10.80 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 3.82 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 5 |

| **ව්‍යාපෘති අංක 14** | **ජීවනෝපාය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද වැඩිහිටි දිවා මධ්‍යස්ථාන අතුරින් තෝරාගත් මධ්‍යස්ථාන සඳහා මුල්‍ය ආධාර සැපයීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 4.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.40 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 2 |


| **ව්‍යාපෘති අංක 15** | **පුහුණුකරුවන් පුහුණු කිරීමේ(TOT)වැඩසටහන (වැඩිහිටියන් සහ නිලධාරීන් සඳහා යෝග අභ්‍යාස සහ සරල අභ්‍යාස සඳහා)** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 7.80 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2.66 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 2 |


| **ව්‍යාපෘති අංක 16** | **වැඩිහිටියන් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 33.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 21.09 |
| භෞතික ප්‍රගතිය | වැඩිහිටියන් 435 |

| **ව්‍යාපෘති අංක 17** | **වැඩිහිටියන් සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 7.20 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 6.33 |
| භෞතික ප්‍රගතිය | වෛද්‍ය කඳවුරු 6 |

| **ව්‍යාපෘති අංක 18** | **විශ්‍රාම පූර්ව වැඩසටහන් පැවැත්වීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.11 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 2.52 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 22 |
| | |
| **ව්‍යාපෘති අංක 19** | **කතරගම වැඩිහිටි නිවාසය සඳහා උපකරණ මිලදී ගැනීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 37.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.26 |
| භෞතික ප්‍රගතිය | ප්‍රවාහන හා දැන්වීම් පළකිරීමේ කටයුතු |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



# 4.5. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

## හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව ක්‍රියාත්මක වන ආයතනයකි. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## අරමුණු

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තතන්ට ඔවුන්ගේ වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට සමාජ ආරක්ෂණය සැලසීම සහ ඔවුන් මියගියවිට ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- තරුණ තරුණියන් ස්වයං රැකියාවල යෙදන ලෙස දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සහ ජීවන තත්වය වැඩි දියුණු කිරීම

## කාර්යභාරය

ධීවර හා කෘෂිකාර්මික අංශවල සේවයේ නියුතු අය හැර වෙනත් ස්වයංරැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලද කාර්යභාරය වූ අතර රජයේ සියලුම අංශවල ශ්‍රමිකයන්ට අදාල වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ සෑම පුරවැසියෙකුම විශ්‍රාම වැටුප් ක්‍රමයකට සම්බන්ධවීමට දිරිමත් කිරීම යන නව රජයේ ප්‍රතිපත්තියට අනුව යමින් 2025 වසරේ සිට ක්‍රියාත්මක වීමට අපේක්ෂිතයි.

## අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 5.00 | 5.00 |
| පුනරාවර්තන | 163.78 | 153.20 |
| එකතුව | 168.78 | 158.20 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීමහාවාරිකමුදල්එකතුකිරීම. |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | සමාජආරක්ෂණඅරමුදල - රු. මි. 5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | - |
| භෞතික ප්‍රගතිය | නවසාමාජිකබඳවාගැනීම්සංඛ්‍යාව: 55,599 |

| | |
|---|---|
| | රැස්කළපළමුවාරිකමුදල :රු.මි.149.34<br>රැස්කළපසු වාරිකමුදල :රු.මි.271.72<br>පසු වාරිකගෙවූසාමාජිකසංඛ්‍යාව:187,072 |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | භාණ්ඩාගාර ප්‍රතිපාදන- රු. මි. 3.0<br>සමාජ ආරක්ෂණ අරමුදල - රු. මි. 3.0 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | භාණ්ඩාගාරප්‍රතිපාදන- රු. මි. 0.977<br>සමාජ ආරක්ෂණ අරමුදල - රු. මි. 1.723 |
| භෞතික ප්‍රගතිය | වැඩ සටහන් : 3,506 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ සාමාජිකයින් සඳහා අනෙකුත් ප්‍රතිලාභ ප්‍රදානය** |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | විශ්‍රාමවැටුප්ගෙවීම් - රු.මි.429.31<br>අනෙකුත්ප්‍රතිලාභගෙවීම්-රු.මි.11.472 |
| භෞතික ප්‍රගතිය | **විශ්‍රාමවැටුප්ගෙවීම්**<br>විශ්‍රාමිකයින්සංඛ්‍යාව : 36,210<br>**අනෙකුත්ප්‍රතිලාභගෙවීම්**<br>ප්‍රතිලාභගෙවීම් සංඛ්‍යාව : 877 |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **පුරවැසියන් හා තරුණ ප්‍රජාව සඳහා ස්වයං රැකියා වෙත යොමුවීම ධෛර්යමත් කිරීමේ හාදැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.9 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.133 |
| භෞතික ප්‍රගතිය | පාසල් ශිෂ්‍ය ප්‍රජාව සහ වෘත්තිය පුහුණුව ලබන තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා පැවැත්වූවැඩසටහන්සංඛ්‍යාව : 177<br>දැනුවත්කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව: 11,620 |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **තොරතුරු තාක්ෂණ පහසුකම් හා කාර්යාල පහසුකම් වර්ධනය** |
| ව්‍යාපෘතියසඳහා ප්‍රතිපාදන (රු.මි) | 5.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 4.89 |
| භෞතික ප්‍රගතිය | පරිගණක උපාංග (14ක්) සහ කාර්යාල උපකරණ (41ක්) දිස්ත්‍රික් කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල වෙත සම්පාදනය කිරීම. |
| | |

# 4.6.ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

## හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council)මඟින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම සිදු කරයි.

## අරමුණු

- ගෝලීය අවශ්‍යතාවයන්ට සහ නව නිපැයුම් සමඟ සමපාත වන නව්‍යකරණ අධ්‍යාපනය හා වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම සහ වෘත්තීය සංවර්ධනය පෝෂණය කිරීම.

- තිරසාරභාවය සහ සමාජ සාධාරණත්වය පෝෂණය කරන සමාජ සංවර්ධන ක්‍රමෝපායයන්ගේ භාවිතය ප්‍රවර්ධනය කිරීම.

- සමාජ සුබසාධනය සහ සංවර්ධන ප්‍රතිඵල වැඩිදියුණු කරන ප්‍රතිපත්ති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමට පදනම් වන සමාජ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සහ විශේෂඥ උපදේශන සේවා සැපයීම.

## කාර්යභාරය

- සමාජ වැඩ වෘත්තියවේදි අධ්‍යාපනයලබාදීම.
- සමාජ වැඩ උපාධි පශ්චාත් උපාධි පවත්වා ගෙන යාම හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ නව උපාධි පාඨමාලා ආරම්භකිරීමට කටයුතු කිරීම. (සමාජවිද්‍යා විශේෂ උපාධිය, මානව විද්‍යා විශේෂ උපාධිය,මනෝවිද්‍යා හා උපදේශන විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය)
- සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
- සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා ප්‍රකාශන පළ කිරීම.
- සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
- සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරීම.
- සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

**අනුමත වාර්ෂික ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය - 2024.12.31 දින දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **ප්‍රාග්ධන (සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම )** | 100.00 | 98.91 |
| **ප්‍රාග්ධන (වෙනත්)** | 15.00 | 15.00 |
| **පුනරාවර්තන** | 170.50 | 150.49 |
| **එකතුව** | 285.50 | 264.40 |

- සීදූව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශය වැය ශීර්ෂය වෙත වෙන් කරනු ලබයි.

**ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදල ප්‍රතිපාදන-2024 සහ ප්‍රගතිය 2024.12.31 දක්වා**

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| **සංවර්ධන** | 27.75 | 11.53 |
| **එකතුව** | 27.75 | 11.53 |

**ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 01** | **ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය** |
| ව්‍යාපෘති සාරාංශය | A හාBවශයෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර 2022 ඔක්තෝබර් මස අවසන් කිරීමට සැලසුම් කරන ලද නමුත් සැලසුම් කාල සීමාව දීර්ඝ කර ඇත.<br>මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම රු. මිලියන 1000ක්වේ.මුළු ඉදිකිරීම් වලින් 1.84% ක් 2024 වර්ෂයේ සිදු කිරීම ඉලක්කගත කරන ලදී. |
| ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන (රු.මි) | 100.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 98.91 (සමුච්චිත 971.74) |
| භෞතික ප්‍රගතිය | 0.03 % (සමුච්චිත 98.19%) |
| | |
| **ව්‍යාපෘති අංක 02** | |
| ව්‍යාපෘති සාරාංශය | ආයතනය සඳහා උපකරණ මිලදී ගැනීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 15.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 14.96 |
| භෞතික ප්‍රගතිය | පරිගණක30, ලැප්ටොප් පරිගණක 16,මල්ටි මීඩියා 11,ඩිජිටල් ස්ක්‍රීන් 02 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | |
| ව්‍යාපෘති සාරාංශය | සමාජ වැඩ උපාධි පාඨමාලාව (සමාජ සේවා විද්‍යාලය) |
| ව්‍යාපෘතිය සඳහා | 13.00 |

| | |
|---|---|
| ප්‍රතිපාදන (රු.මි) | |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 13.00 |
| භෞතික ප්‍රගතිය | • සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2018/2019 - සිසුන් 42, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2019/2020- සිසුන්86 සඳහා උපාධිප්‍රදානෝත්සවය පැවැත්වීම, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2020/2021- සිසුන්157, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2021/2022- සිසුන් 403, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2022/2023-සිසුන් 183, සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව 2023/2024- සිසුන් 165 අධ්‍යන කටයුතු සිදුකිරිම.<br>• ශිෂ්‍ය සුභසාධන කටයුතු වෙනුවෙන් (ශිෂ්‍යාධාර) සිසුන් 360 සඳහා ගෙවීම් කිරීම. |
| | |
| **ව්‍යාපෘති අංක 04** | |
| ව්‍යාපෘති සාරාංශය | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පුහුණු අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.28 |
| භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් 288 ක් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් 05ක් පැවැත්වීම, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලව සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරිම, ක්ෂේත්‍ර උපදේශකවරුන් 148ක් සඳහා වැඩමුළු 02ක් පැවැත්වීම. |
| | |
| **ව්‍යාපෘති අංක 05** | |
| ව්‍යාපෘති සාරාංශය | පර්යෙෂණ හා ප්‍රකාශන එළිදැක්වීම, සම්මන්ත්‍රණ හා පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම (පර්යෙෂණ හා ප්‍රකාශන අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 2.0 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.62 |
| භෞතික ප්‍රගතිය | සමාජ විද්‍යා ඊ-සඟරා 02, සමාජ වැඩ ඊ-සඟරා 02, සමාජ වැඩ පිළිබඳ ශිෂ්‍ය ඊ-සඟරා 01, පුවත් ඊ-හසුන් 02, කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 01, පර්යේෂණ සම්මන්ත්‍රණ 01, වර්තමාන සමාජ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ 01, සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 01 ක් පැවැත්වීම. |
| | |
| **ව්‍යාපෘති අංක 06** | |
| ව්‍යාපෘති සාරාංශය | අධ්‍යයන වැඩසටහන් වල තත්ත්ව සහතිකකරණය (තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 5.0 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 4.12 |
| භෞතික ප්‍රගතිය | නව උපාධි පාඨමාලා විෂය නිර්දේශ සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම, නව උපාධි පාඨමාලාවලට අදාල සමාලෝචන පැවැත්වීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදුකරන ආයතනික සමාලෝචනය (Institutional Review)වැඩසටහන පැවැත්වීම. |

| ජාතික සමාජ සංවර්ධන ආයතන අරමුදල මඟින් පවත්වන වැඩසටහන් | |
|---|---|
| | |
| **ව්‍යාපෘති අංක 07** | |
| ව්‍යාපෘති සාරාංශය | අධ්‍යයන වැඩසටහන් වල තත්ත්ව සහතිකකරණය |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 18.48 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 7.36 |
| භෞතික ප්‍රගතිය | නව උපාධි පාඨමාලා විෂය නිර්දේශ සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදුකරන ආයතනික සමාලෝචනය සහ ඒ සඳහා ගෙවීම (Institutional Review) සිදුකිරීම. ආයතනය සඳහා නව වෙබ් අඩවිය සකස්කර අවසන් කිරීම.Wing Bගොඩනැගිල්ල ජාලගත කිරීම අවසන් කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 08** | |
| ව්‍යාපෘති සාරාංශය | නව පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරිම (සමාජ වැඩ අධ්‍යයන අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.2 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.850 |
| භෞතික ප්‍රගතිය | ආචාර්ය උපාධි 01, දර්ශනපති උපාධි 01 හා ශාස්ත්‍රපති උපාධි 01 පාඨමාලාවන් සඳහා විෂයමාලා සංවර්ධනය කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 09** | |
| ව්‍යාපෘති සාරාංශය | නව උපාධි පාඨමාලා ආරම්භ කිරිම (මානව විද්‍යා හා වෘද්ධ විද්‍යා අධ්‍යයන අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.12 |
| භෞතික ප්‍රගතිය | මානව විද්‍යා විශේෂ උපාධිය හා වෘද්ධ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍ර සකස් කර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 10** | |
| ව්‍යාපෘති සාරාංශය | නව උපාධි පාඨමාලා ආරම්භ කිරිම (සමාජ විද්‍යා හා සමාජ සංවර්ධන අධ්‍යයන අංශය ) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.071 |
| භෞතික ප්‍රගතිය | සමාජ විද්‍යා විශේෂ උපාධිය සඳහා සංශෝධනය කරන ලද යෝජනා පත්‍රය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 11** | |
| ව්‍යාපෘති සාරාංශය | නව උපාධි පාඨමාලා ආරම්භ කිරිම (මනෝවිද්‍යා හා උපදේශන අධ්‍යයන අංශය) |

| | |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.133 |
| භෞතික ප්‍රගතිය | මනෝවිද්‍යා හා උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාවේ සංශෝධනය කරන ලද විෂය නිර්දේශයSCAQA පැනල මණ්ඩලයට ඉදිරිපත් කර එම නිර්දේශ අනුව නැවත සකස් කර ඇත. |
| | |
| **ව්‍යාපෘති අංක 12** | |
| ව්‍යාපෘති සාරාංශය | සිසුන් සඳහා නේවාසික පහසුකම් හා සුබසාධන වැඩසටහන් පැවැත්වීම (ශිෂ්‍ය සුබසාධන අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.0 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.134 |
| භෞතික ප්‍රගතිය | උපාධි පාඨමාලාවන්හි සිසුන් 336ක් සඳහා මානසික සෞඛ්‍ය හා උපදේශනය පිළිබඳ වැඩසටහන් 02, පෞරුෂත්ව සංවර්ධන වැඩමුළු 01 හා ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීම |
| | |
| **ව්‍යාපෘති අංක 13** | |
| ව්‍යාපෘති සාරාංශය | විෂය නිර්දේශ සංවර්ධන මධ්‍යස්ථානය |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.0 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.650 |
| භෞතික ප්‍රගතිය | මානව විද්‍යා විශේෂ උපාධිය, බෞද්ධ විද්‍යා විශේෂ උපාධිය හා සමාජ විද්‍යා විශේෂ උපාධිය විෂය නිර්දේශ සමාලෝචනය කිරීම හා අංශයට අදාළ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 01, ඩෙක්ස්ටෝප් පරිගණක යන්ත්‍රයක් හා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් මිලදී ගැනීම |
| | |
| **ව්‍යාපෘති අංක 14** | |
| ව්‍යාපෘති සාරාංශය | පුස්තකාල සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.572 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.564 |
| භෞතික ප්‍රගතිය | 100% - පුස්තකාලය ඩිජිටල්කරණය කිරීම |
| | |
| **ව්‍යාපෘති අංක 15** | |
| ව්‍යාපෘති සාරාංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම (ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.155 |
| භෞතික ප්‍රගතිය | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු වැඩමුළු 03 ක් පැවැත්වීම හා මෙහෙයුම් කමිටු රුස්වීම 01ක් පැවැත්වීම. |
| | |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 16** | |
| ව්‍යාපෘති සාරාංශය | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උපාධි සිසුන් ඇතුලත් කර ගැනීම,විභාග පැවැතවීම, උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම. (ලේඛකාධිකාරී අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.5 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.5 |
| භෞතික ප්‍රගතිය | 2023 සමාජවැඩ උපාධිය සඳහා සිසුන් බඳවා ගැනීම. සිසුන් 162 බඳවා ගැනීම, උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම. |

**ආයතනය මගින් මුදල් අයකර පවත්වන ලද පාඨමාලා**


| | |
|---|---|
| **ව්‍යාපෘතිඅංක17** | |
| ව්‍යාපෘති සාරාංශය | සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය 2021/2022, 2022/2023, සමාජවැඩ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 (සමාජ සේවා විද්‍යාලය) |
| ව්‍යාපෘතිය සඳහා ආදායම | 17.05 |
| වියදම | 12.963 |
| භෞතික ප්‍රගතිය | 2021/2022 ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සිසුන් 67 ,2022/2023 ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සිසුන් 150, 2022/2023 සමාජ වැඩ ඩිප්ලෝමා සිසුන් 30 |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 18** | **ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම** |
| ව්‍යාපෘති සාරාංශය | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023, උපදෙශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023, උපදෙශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2023/2024 (සීදූව, කිලිනොච්චි, යාපනය), උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025 (සීදූව, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, නුවර, තලාව)ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හා සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාව (පුහුණු අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ආදායම (රු.මිලි.) | 14.26 |
| වියදම (රු.මිලි.) | 7.51 |
| භෞතික ප්‍රගතිය | • උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 සිසුන් 21 හා, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2022/2023 සිසුන් 243 ක් සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රධානෝත්සවය පවත්වා ඇත.<br>• උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2023/2024 (සීදූව, කිලිනොච්චි, යාපනය) පාඨමාලා 6 ක සිසුන් 240.<br>• උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025 (සීදූව, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, නුවර, තලාව) පාඨමාලා 8 ක සිසුන් 320.<br>• ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හා සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාවන් 2ක සිසුන් 100 දෙනෙකු සඳහා 2025 ජනවාරි මස විභාග පැවැත්වීමට සැලසුම් කර ඇත. |


| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 19** | |
| ව්‍යාපෘති සාරාංශය | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පර්යේෂණ අංශය) |
| ව්‍යාපෘතිය සඳහා ආදායම | 1.49 |
| වියදම | 0.476 |

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සිසුන්45 දෙනෙකු අවසන් කර ඇත. පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 35 දෙනෙකු ලියාපදිංචි වී ඇත. |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ ප්‍රගතිය




## 2022 සිට 2024 දක්වා මුදල් අයකර පවත්නු ලබන පාඨමාලා තුළින් ලබාගත් ආදායම හා 2025 වර්ෂයේ අපේක්ෂිත ආදායම



# 4.7. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

## හැඳින්වීම

සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය හරහා ග්‍රාමීය ජනතාව සෘජුව නිෂ්පාදන කාර්යයට සම්බන්ධ කර ගනිමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරීම පිණිස සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හඳුන්වාදෙන ලද අතර එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින්, අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කිරීමත් ග්‍රාමශක්ති වැඩසටහන මගින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් සිදුකරමින් පවත්වාගෙන යමින් 2021 වර්ෂයේ සිට 2024 දක්වා ක්‍රියාත්මක කර ඇත.

මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලැබූ ඉහත වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කෙරුණු ව්‍යාපෘති සාර්ථක කරගැනීමට අවශ්‍ය මැදිහත්වීම් තවදුරටත් සිදු කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුව 2025 වර්ෂයේ සිට සාකල්‍ය ප්‍රවේශයකින් හා ප්‍රජා සහභාගිත්වයකින් යුතුව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් බහුමාන දරිද්‍රතාවයෙන් ග්‍රාමීය ජනතාව ක්‍රමිකව මුදවා ගනිමින් ආර්ථික, සමාජ පාරිසරික යන අංග අතර ඒකාබද්ධතාවයකින් යුතුව තිරසාර ග්‍රාමීය සංවර්ධනයක් ඇතිකිරීමට අපේක්ෂා කෙරේ.

## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනෙහි අරමුණු

- මූලික පහසුකම් (යටිතල පහසුකම් සහ සේවා) උදෙසා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම
- වඩා යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ග්‍රාමීය පවුල්/ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම.
- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වයන් ප්‍රවර්ධනය කිරීම.
- සමාජ සංවර්ධනය මගින් සමාජ ගැටලු අවම කිරීම.
- තිරසර සංවර්ධනය සඳහා පරිසරය සංරක්ෂණය කිරීම.
- ග්‍රාමීය සංවර්ධනය සඳහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පාලන ව්‍යුහයක් ස්ථාපිත කිරීම.

## අනුමත වාර්ෂික ප්‍රතිපාදන2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා


| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 150.00 | 130.15 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | නව නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාවය, නිෂ්පාදන විභවතාව, වෙළඳපොළ හා තිරසාරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පදනම් කරගනිමින් , අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ගම්මාන නිෂ්පාදන ගම්මාන ලෙස සංවර්ධනය කිරීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 115.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 103.66 |

| | |
|---|---|
| භෞතික ප්‍රගතිය | නව ගම්මාන 45 |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **පවතින නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම** |
| ව්‍යාපෘති සාරාංශය | දැනට පවත්නා නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමට අදාළ පහසුකම් සැපයීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 24.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 18.02 |
| භෞතික ප්‍රගතිය | ගම්මාන 20 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **කුඩා වෙළඳ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම** |
| ව්‍යාපෘති සාරාංශය | නිෂ්පාදන ගම්මානවල අලෙවි කටයුතුවලට සහායවීම සඳහා කුඩා පරිමාණයේ වෙළඳ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීමට අදාළ පහසුකම් සැලසීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 7.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 5.45 |
| භෞතික ප්‍රගතිය | කුඩා වෙළඳ මධ්‍යස්ථාන 5 |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **අලෙවි ප්‍රදර්ශන පැවැත්වීම** |
| ව්‍යාපෘති සාරාංශය | නිෂ්පාදන ගම්මානවල නිෂ්පාදන අලෙවිකිරීම දිරිගැන්වීම සඳහා එම නිෂ්පාදන ඇතුළත් වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීමට අදාළ පහසුකම් සැපයීම |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.00 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.60 |
| භෞතික ප්‍රගතිය | අලෙවි ප්‍රදර්ශන17 |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **පුහුණු හා තාක්ෂණික දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘති සාරාංශය | නිෂ්පාදන ගම්මානවල නිෂ්පාදන කාර්යය සිදුකරන පුද්ගලයන් සඳහා අදාළ තාක්ෂණික දැනුවත්කිරීම් සහ අදාළ අනෙකුත් පුහුණු අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීම. |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.01 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 49 |

**2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය**



# 4.8. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## හැඳින්වීම

1974 වර්ෂයේ දී ආරම්භ වූ මෙම ආයතනය, 1978 වර්ෂයේ සිට ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තිකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාවගේ විභව ශක්තීන් මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි. දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණපාන අවාසිදායක තත්ත්වය, වඩා වාසිදායක තත්වයක් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

## අරමුණු

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමනාකරණය කිරීම.
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළනැංවීම
- නවෝත්පාදන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම

## කාර්යභාරය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ විද්වත් හා විශේෂඥ දැනුම සමාජගත කිරීම
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව ග්‍රාමීය සංවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පවුල් හා ප්‍රජා මූල සංවිධාන සවිබලගැන්වීමට සෘජුව සම්බන්ධ වන පරිදි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- ප්‍රතිපත්ති සම්පාදකයින් /සංවර්ධනවේදීන් සඳහා තොරතුරු සම්පාදනය.
- සේවා හා ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම
- නව සංවර්ධන ප්‍රවේශයන් සමාජගත කිරීම

## අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 15.00 | 12.48 |

## ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| ව්‍යාපෘති අංක 01 | කෘෂිකාර්මික හා අපනයන භෝග ක්ෂේත්‍රවල ඇති සුවිශේෂී තත්ත්වය හේතුවෙන් ග්‍රාමීය සමාජයට සිදු වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.25 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.15 |
| භෞතික ප්‍රගතිය | අධ්‍යයන වාර්තාවඅවසන් කිරීම |
| | |

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 02** | **වෙළෙඳපොළ පදනම් කරගත් එළවළු නිෂ්පාදනය සහ අලෙවිය පිළිබඳ සමීක්ෂණය** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.08 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.03 |
| භෞතික ප්‍රගතිය | අධ්‍යයන වාර්තාව අවසන් කිරීම |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ පවුල් මුහුණ දෙන ගැටළු පිළිබඳ සිද්ධි අධ්‍යයනය** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.08 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.04 |
| භෞතික ප්‍රගතිය | ඇගයීම් වාර්තාව අවසන් කිරීම |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම පිළිබඳ ක්‍රියාකාරී පුහුණුව.** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.95 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.95 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 9 |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ නිරත වූ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් පැවැත්වීම (අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීම සඳහා ගෘහ කළමනාකරණය සහ පවුල් සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී පුහුණු මැදිහත්වීම)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.08 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.67 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 12 |
| | |
| **ව්‍යාපෘති අංක 06** | **ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ නිරත වූ ක්ෂේත්‍ර නිලධාරීන් සහ ග්‍රාමීය නායකයින් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන්වැඩසටහන් පැවැත්වීම(අස්වැසුමප්‍රතිලාභී පවුල් සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු මැදිහත්වීම)** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.60 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.34 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 7 |
| | |
| **ව්‍යාපෘති අංක 07** | **ඇස්වැසුම වැඩසටහනේ නියැලී සිටින ක්ෂේත්‍ර නිලධාරීන් සහ ග්‍රාමීය නායකයින් සඳහා ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම් සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.50 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.44 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 6 |
| | |


| **ව්‍යාපෘති අංක 08** | **සහභාගීත්ව සංවර්ධනයට අදාළව පළාත් මට්ටමේ පුහුණු සංචිත ගොඩනැගීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.40 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.38 |
| භෞතික ප්‍රගතිය | පුහුණු සංචිත 9 |

| **ව්‍යාපෘති අංක 09** | **පළාත් පාලන ආයතන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් සඳහා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.85 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.91 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 10 |

| **ව්‍යාපෘති අංක 10** | **ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ට ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායක වීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම** |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.59 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.46 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 4 |

| **ව්‍යාපෘති අංක 11** | **ග්‍රාමීය සංවර්ධනය හා සම්බන්ධ ප්‍රකාශන නිකුත්කිරීම** |
|---|---|
| ව්‍යාපෘති සාරාංශය | විද්‍යුත් ප්‍රකාශන ලෙස නිකුත්කරයි |
| භෞතික ප්‍රගතිය | 1 වන වෙළුම සහ දෙවන වෙළුම අවසන් කිරීම |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



## 4.9. උපදේශන අංශය

### හැඳින්වීම

ප්‍රජාව මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික අසමතුලිතතා හා විවිධාකාර මනෝ සමාජීය ගැටලු සඳහා, මනෝවිද්‍යාත්මක උපදේශන හා ප්‍රතිකාරාත්මක ක්‍රමවේද භාවිතා කරමින් මානසික යහපැවැත්ම ගොඩනැගීම මෙම අංශය මඟින් සිදු කරයි.

### අරමුණු

- ප්‍රජාව මානසික ව්‍යාකූලතාවන්ට ගොදුරුවීම අවම කිරීම තුළින් මානසික යහපැවැත්ම ගොඩනැංවීම හා මානසික සවිබලගැන්වීම

### කාර්යභාරය

- පුද්ගලයින් මුහුණපාන මානසික ගැටළුකාරී තත්වයන්, මානසික ආබාධ, මානසික ලෙඩ රෝග හා විවිධාකාර මනෝසමාජයීය ගැටළු හඳුනාගෙන එම තත්වයන් අවම කිරීමට අදාළ උපදේශන වැඩසටහන් සිදු කිරීම.
- ප්‍රජාව මානසිකව සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය සිදුකිරීම
- මානසික ආබාධ හා මානසික ගැටළු සහිත සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවාවක් සැපයීම.
- උපදේශන සේවයේ නියුතු වෘත්තිකයන් අතර විධිමත් සහසම්බන්ධතාවයක් ඇති කිරිම.
- උපදේශන සේවා ලබාදීම පිළිබඳ අධීක්ෂණය හා මඟපෙන්වීම.

### අනුමත වාර්ෂික ප්‍රතිපාදන 2024 සහ ප්‍රගතිය - 2024.12.31 දක්වා

| | ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| ප්‍රාග්ධන | 6.00 | 5.76 |


### ප්‍රධාන සංවර්ධන වැඩසටහන්හි 2024.12.31 දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති අංක 01** | **මනෝ සමාජීය ගැටළු පදනම්කරගත් කණ්ඩායම් උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 3.23 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 3.23 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 6,664<br>ප්‍රතිලාභීන් 311,295 |
| | |
| **ව්‍යාපෘති අංක 02** | **තරුණ සංවිධාන සඳහා ප්‍රාදේශීය මට්ටමින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 746 |

| | |
|---|---|
| | ප්‍රතිලාභීන් 37,116 |
| | |
| **ව්‍යාපෘති අංක 03** | **අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ මානසික ඒක්‍රාග්‍රතාවය වැඩිදියුණුකිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 86<br>ප්‍රතිලාභීන් 1,454 |
| | |
| **ව්‍යාපෘති අංක 04** | **සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති පුවක්පිටිය - පුනරුත්ථාපන මධ්‍යස්ථානය, කැටවල - වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, තෙළඹුයාය - වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා“රියන්සි අලගියවන්න” කාන්තා රැකවරණ මධ්‍යස්ථානය යන ආයතනවලඋපදේශන වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 74<br>ප්‍රතිලාභීන් 204 |
| | |
| **ව්‍යාපෘති අංක 05** | **ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව“වික්ටෝරියා” නිවාසයෙහි උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 12<br>ප්‍රතිලාභීන් 120 |
| | |
| **ව්‍යාපෘති අංක 06** | **පූර්වවිවාහ වැඩසටහන් පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 452<br>ප්‍රතිලාභීන් 16,682 |
| | |
| **ව්‍යාපෘති අංක 07** | **මානසික සෞඛ්‍ය සතිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 1.57 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 1.57 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 24<br>ප්‍රතිලාභීන් 2,874 |
| | |
| **ව්‍යාපෘති අංක 08** | **ගම්පහ, පන්නල, කතරගම වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා උපදේශන සායන පැවැත්වීම** |
| ව්‍යාපෘතිය සඳහා | ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්තකර ඇති උපදේශන නිලධාරීන් විසින් |

| | |
|---|---|
| ප්‍රතිපාදන (රු.මි) | ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කොට ඇත. |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 45<br>ප්‍රතිලාභීන් 122 |
| | |
| **ව්‍යාපෘති අංක 09** | **ජංගම දුරකථන හරහා උපදේශන සේවය ලබාදීම** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.12 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.075 |
| භෞතික ප්‍රගතිය | දුරකථන ඇමතුම් 3,312 ක් හරහාඋපදේශන සේවය ලබාදීම |
| | |
| **ව්‍යාපෘති අංක 10** | **උපදේශන නිලධාරීන්ගේකුසලතා සංවර්ධන වැඩසටහන්** |
| ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන (රු.මි) | 0.40 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි) | 0.40 |
| භෞතික ප්‍රගතිය | වැඩසටහන් 5<br>ප්‍රතිලාභීන් 329 |

## 2022 සිට 2024 දක්වා සංවර්ධන වැඩසටහන් සඳහා අනුමත වාර්ෂික ප්‍රතිපාදන සහ ප්‍රගතිය



# 4.10. විදේශ ව්‍යාපෘති

## 4.10.1.ණය සංචරක

බහුමාන දරිද්‍රතාවයට මුහුණ පා ඇති පවුල් සංඛ්‍යාව අවම කිරීම අරමුණු කර ගනිමින් අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන මෙම අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන වැඩසටහනක් වන අතර එහි නියමු ව්‍යාපෘති 02ක් ලෙස ලෝක බැංකු ණය ආධාර හා ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ මේ වන විට ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

### නියමු ව්‍යාපෘති අංක 01 - ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර ව්‍යාපෘතිය

අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් ලෙසආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යොදා ගනිමින් අස්වැසුම ප්‍රතිලාභීන් අතරින් දිළිඳු හා අන්ත දිළිඳු පවුල් 12,800ක් සවිබලගැන්වීම අරමුණු කර ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ආහාර සුරක්ෂිතතාවය හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් වන අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. මෙය 2022.09.09 වර්ෂයේ සිට 2026.08.29 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇති අතර එහි ඇස්තමේන්තුගත මුදල ඇමරිකානු ඩොලර් මිලියන 7 කි. මේ යටතේඅනුරාධපුර, පොළොන්නරුව, මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, කෑගල්ල, කළුතර, යාපනය, කිලිනොච්චි, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව යන දිස්ත්‍රික්ක ආවරණය වේ.

මෙම ව්‍යපෘතියට අදාලව රුපියල් මිලියන 11.76 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ඒ යටතේ ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු අවසන් කර ඇත. මේ වන විට ප්‍රතිලාභීන් බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. මීට අමතරව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින සමනලවැව හා නිල්ලඹ පිහිටි පුහුණු කිරීමේ ම්‍යස්ථාන වල අළුත්වැඩියා කටයුතු ද මේ යටතේ සිදුකරමින් පවතී.

### නියමු ව්‍යාපෘති අංක 02 - ලෝක බැංකු මූල්‍යාධාර ව්‍යාපෘතිය

අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහනේ නියමු ව්‍යාපෘතියක් ලෙස ලෝක බැංකු මූල්‍යාධාර යොදාගනිමින් අස්වසුම ප්‍රතිලාභීන් අතරින් දිළිඳු හා අන්ත දිළිඳු පවුල් 10, 975 ක් සවිබලගැන්වීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය 2023.12.14 සිට 2027.09.30 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇති අතර මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8 ක් වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ පුත්තලම, කොළඹ, මොණරාගල, මන්නාරම, බදුල්ල, අම්පාර, රත්නපුර හා වවුනියාව යන දිස්ත්‍රික්ක ආවරණය වේ.

මෙම ව්‍යපෘතියට අදාලව රුපියල් මිලියන 4.3 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ඒ් යටතේ ව්‍යාපෘති සැලසුම්කරණ කටයුතු අවසන් කර ඇති අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

## 4.10.2. ප්‍රදාන සංචරකය

ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 1.98 ක ප්‍රදාන සංචරකයක් ක්‍රියාත්මක වන අතර එය 2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය. මෙහිදී මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ කාන්තා හා ළමා කටයුතු

අමාත්‍යාංශය යටතේ ඇති පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙම අමාත්‍යාංශයට අදාල ආයතන සඳහා රුපියල් මිලියන 205.794 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර2022.09.09 සිට 2024.12.31 දක්වාරුපියල් මිලියන 52.87 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. එයට අදාල භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- අකුරැස්ස ළමා රැකවරණ මධ්‍යස්ථානය සඳහා ලී බඩු හා උපකරණ ලබා දී ඇත.
- රැකවරණ මධ්‍යස්ථාන 30 ක් සඳහා උපකරණ ලබා දී ඇති අතර රැකවරණ මධ්‍යස්ථාන 8ක අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.
- ආබාධිත පුද්ගලයින් 550 ක් සඳහා උපදේශන වැඩසටහන් 11ක් පවත්වා ඇත.
- ආබාධිත දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල 427ක් ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් 61 දෙනෙකු සඳහා ජංගම අලෙවි රථ ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් 675 ක් සඳහා රැකියා පුහුණු වැඩසටහන් සිදු කර ඇත.
- ආබාධිත පුද්ගලයන් 20 ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දී ඇත.
- ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ නිවෙස් වල සිටින පුද්ගලයින් 1477 ක් සඳහා පුහුණු වැඩසටහන් සිදු කර ඇත.

# 4.11. අනෙකුත් මෙහෙයුම් අංශ

## පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛ වලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශ වලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාල ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ,පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරීම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඒ අනුව, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ කුසලතා හා දැනුම සංවර්ධන පුහුණු වැඩසටහන්15 ක් හා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහනක් පිළිවලින් නිලධාරීන් 1000 ක් හා 71 ක් සහභාගිත්වයෙන් පවත්වන ලදී. එසේම තනි පුද්ගල පුහුණු වැඩසටහන් 14 ක් යටතේ නිලධාරීන් 65 දෙනෙක් යොමු කර ඇත.

## සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ සංවර්ධන අංශයන් තුනක් ක්‍රියාත්මක වේ. සංවර්ධන අංශයන්හි ප්‍රධාන කාර්යභාරයවනුයේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනයන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා උපදෙස් ලබාදීම, මඟ පෙන්වීම හා මෙහෙයවීම සිදු කිරීම මෙම වේ. එහිදී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය සහ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) මගින්ද සමාජ ආරක්ෂණය අවැසි පුද්ගලයන් සඳහා හඳුනාගත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන අතිරේක ලේකම් (සමාජ ආරක්ෂණ) මගින්ද ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලියෙහි නියුතු ආයතන අතිරේක ලේකම් (ප්‍රජා සවිබලගන්වීම්) මගින්ද අධීක්ෂණය කරනු ලබයි.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මගින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වා ගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ. අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩල වල ගිණුම් සුපරීක්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය , කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## සැලසුම් හා මෙහෙයුම් අංශය

ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගන්වීම් අමාත්‍යාශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශය යටතේ සිදුවේ. තවද විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි සම්බන්ධිකරණ හා අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.